# මිනුවන්ගොඩ ප්‍රාදේශිය සභාව.

# ගම්පහ දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 13 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ජනවාරි 04 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්සණය කරනු ලැබේ.

(අ) සභාවේ නව ගොඩනැගිල්ලට විදුලි සෝපානයක් සවි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ ණයවර ලිපිය මගින් ගෙවා තිබූ රු.2,158,538 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ණය ශේෂය රු.19,377,186 ක් ලෙස නිරීක්ෂණය වුවද රු.13,653,123. ක් පමණක් ගිණුම්වල දැක්විණ.

(ඇ) නිකුත් කිරීම් නියෝග අනුව වර්ෂය තුළ ගබඩාවෙන් නිකුත් කර තිබූ ද්‍රව්‍ය / උපකරණවල වටිනාකම රු.32,983,636 ක් වුවද, රු.28,610,934 ක් පමණක් ගිණුම් ගතකර තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ දී කපාහැර තිබූ රු.4,376,225 ක් වූ ණයගිම් ශේෂය සමාලෝචිත වර්ෂයේදී ද නැවත කපාහැර තිබීම නිසා ගබඩා ණයහිමි ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්විණ.

1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම්</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු161,245,366 ක් වූ ස්ථාවර වත්කම් විගණනයේදී සතුටුදායක ලෙස සනාථ කර ගැනීමට සාක්ෂි නොවීය.

1.3.3 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

ගිණුම් විෂයන් 02 කට අදාළව පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.1,347,419 ක් වූ අතර, ලෙජර් ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.1,248,889 ක් විය. ඒ අනුව රු.98,530 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 <u>ලැබිය යුතු ගිණුම්</u>

සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොකල අත්තිකාරම් ශේෂය රු.7,502,111 ක් වූ අතර, වසරක් ඉක්මවා තිබූ ශේෂ වල එකතුව රු. 1,486,615 ක් විය. මෙම අත්තිකාරම් වලින් වැඩි ප්‍රමාණයක් මාර්ග සකස් කිරීමේ කොන්ත්‍රාත් සඳහා දී තිබුණි.

1.3.5 <u>අයවීමට ඇති සේවක ණය</u>

2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.7,986,578 ක් වූ අතර අවු.03 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟ හිටි ගිණුම් ශේෂවල එකතුව රු.16,586 ක් විය.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 19,506,754 ක්වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 28,608,424 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

<u>හිඟ හිටි වරිපනම්</u>

සමාලෝචිත වර්ෂය අවසානයට රු.9,780,586 ක හිඟ වරිපනම් ශේෂයෙන් එක් වරිපනම් ඒකකයකින් හඟ රු.5,000 ඉක්මවන ශේෂවල වටිනාකම රු.1,955,525 ක් විය.

(ආ) <u>හිඟ හිටි ජල ගාස්තු</u>

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ හිටි ජල ගාස්තු රු.335,546 ක් වූ අතර හිඟ රු.5,000 ඉක්මවන ඒකක 15 කින් රු.104,007 ක් අයවීමට තිබුණි.

2.3 <u>අභ්‍යන්තර විගණනය</u>

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) කොන්ත්‍රාත් පාලනය

(ඇ) වත්කම් කළමනාකරණය